# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත

---

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 ජූලි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 1.0[illegible] යි.

# 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 26 වන දින.]

එල්. ඩී.—ඕ. 27/94

**ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද. වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවීම

සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවීම.

2. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ ද, සමාජ ආරක්ෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද, මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තව ද මණ්ඩලය විසින් ද මණ්ඩලයට විරුද්ධව ද එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්

3. (1) මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් සත් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් එක් අධ්‍යක්ෂවරයෙක් භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් විය යුතු ය.

(2) අධ්‍යක්ෂවරුන් අතුරෙන් එක් අධ්‍යක්ෂවරයෙක් මණ්ඩලයේ සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාල සහ අධ්‍යක්ෂවරයන්ට ගෙවනු ලබන පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ මණ්ඩලයේ මුද්‍රාවට අදාළව, මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන බලපැවැත් විය යුතු ය.

මණ්ඩලයේ කර්තව්‍ය

4. පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ කර්තව්‍ය වනුයේ, ධීවර හා කෘෂිකර්ම නොවන අංශවල ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුපක් සහ (මෙහි මින් මතු "යෝජනා ක්‍රමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ ඒ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම විය යුතු ය.

2—ඩී 039841 (96/04)

මණ්ඩලයේ බලතල.

5. ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්යය සඳහා මණ්ඩලයට—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ, උකස් කිරීමේ, විකිණීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ;

(ආ) එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට සෘජුවම හෝ යම් නිලධරයකු හෝ ඒ වෙනුවෙන් බලය දෙන ලද අනුයෝජිතයකු මගින් ඇතුළත් වීමේ සහ ඒවා ඉටු කිරීමේ;

(ඇ) එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, පාරිශ්‍රමික, විනය පාලනය සහ ඔවුනට නිවාඩුදීම ද ඇතුළුව ඔවුනට අදාළ රීති සෑදීමේ;

(ඈ) යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ;

(ඉ) යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ නියමිත ජීවනගණක, මූල්‍ය සහ මෙහෙයුම් වාර්තා පවත්වාගෙන යාමේ;

(ඊ) යෝජනා ක්‍රමය යටතේ යම් දායකයකුට ගෙවිය යුතු ප්‍රතිලාභ නිශ්චය කිරීමේ;

(උ) එහි කාර්යයන් නියමාකාරයෙන් ඉටුකිරීම සඳහා හෝ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව අවශ්‍යවන වෙනත් සියලු දේවල් කිරීමේ

බලය තිබිය යුතු ය.

පනත අදාළ කිරීම.

6. යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ හැකියාව සහ ස්වයං රැකියාවල යෙදෙන තැනැත්තන් විසින් කරගෙන යනු ලබන වෘත්තීන් වලට සම්බන්ධ වෘත්තීය අනතුරු සැලකිල්ලට ගනිමින්, යෝජනා ක්‍රමයට දායකවීමේ හිමිකම ඇති ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් පිළිබඳ වර්ග නිශ්චය කිරීම, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් කල කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ කරන ලද නියමයක සඳහන් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ වර්ගයට ඇතුළත් වන යම් ස්වයං රැකියා තැනැත්තකු මෙහි මින් මතු “මේ පනත අදාළ වන්නා වූ තැනැත්තකු” වශයෙන් හඳුන්වනු ලැබේ.

## II වන කොටස

## ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

යෝජනා ක්‍රමයට බැඳීම සඳහා සුදුසුකම්.

7. නියමිත සුදුසුකම් ඇත්තා වූ ද, වයස අවුරුදු දහ අටට නොඅඩු වයස අවුරුදු පනස් නවයට නොවැඩි වන්නා වූ ද සහ මේ පනත අදාල වන්නා වූ ද යම් තැනැත්තකු යෝජනා ක්‍රමයට බැඳීම සඳහා සුදුස්සකු වන්නේ ය.

යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ.

8. (1) (මෙහි මින් මතු "දායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යෝජනා ක්‍රමයට බැඳෙන්නා වූද මේ පනත අදාල වන්නා වූද යම් තැනැත්තකු, නියම කරනු ලැබිය හැකි යම් පදනමක් මත යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභවලට හිමිකම් තිබිය යුතු ය:—

(අ) නියමිත මුදලක් වූ නියත කාලීන විශ්‍රාම වැටුපක් ;

(ආ) ස්ථිර වශයෙන්ම අර්ධ ආබාධිත තත්ත්වයක දී පාරිතෝෂික වශයෙන් ගොනු මුදලක් හෝ ආබාධිත තත්වයට පත්වීමෙන් පසු ඔහු දායක මුදල් ගෙවීම නොකඩවා කරතොත් ගෙවිය යුතු අවස්ථාව වන විටෙක පාරිතෝෂිකයක් වශයෙන් ගොනු මුදලක් සහ විශ්‍රාම වැටුපක් ;

(ඇ) ස්ථිර වශයෙන් ම පූර්ණ ආබාධිත තත්ත්වයක දී, පාරිතෝෂික වශයෙන් ගොනු මුදලක් හෝ නියමිත මුදලක් වූ නියත කාලීන දීමනාවක් ;

(ඈ) මරණ පාරිතෝෂිකයක්.

විශ්‍රාම වැටුප් ගෙවිය යුත්තේ කවර විටකද සහ ඔවි.

(2) විශ්‍රාම වැටුප්, දීමනාවක් හෝ පාරිතෝෂිකයක් ගෙවීමේ පදනම වෙනත් දේ අතර, දායකයාගේ දායක කාල පරිච්ඡේදය වයස සහ දායකයා විසින් දෙන ලද දායක මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගැනීමෙන් නියම කරනු ලැබිය යුතු ය.

9. (1) වයස අවුරුදු හැටට එළඹීමේ දී දායකයකු විශ්‍රාම වැටුපකට හිමිකම ලැබිය යුතු ය. කෙසේ වුවද, වයස අවුරුදු පනස් පහට එළඹීමෙන් පසුව දායකවීම ආරම්භ කරන දායකයකු නියම කරනු ලැබිය හැකි ඔහුගේ මුළු දායක මුදල ගෙවීමෙන් පසුව සහ යෝජනා ක්‍රමයට බැඳීමේ දින සිට අවුරුදු පහක් අවසානයේ දී පමණක් විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය.

(2) දායකයකු මියයන මාසයේ අවසානය දක්වා පමණක් විශ්‍රාම වැටුප් ගෙවනු ලැබිය යුතු ය.

දායක මුදල් මත දෙනු ලබන ප්‍රතිපාදනය

10. මේ පනත අදාල වන තැනැත්තන් යෝජනා ක්‍රමයට බැඳීම ධෛර්යමත් කිරීමේ අදහසින්, දායකයන් විසින් ගෙවනු ලබන දායක මුදල් මත ප්‍රතිදානයක් හෝ වට්ටමක් දිය යුතු යයි අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

අර්ධ අබලතාවකට පත්වීම.

11. ස්වකීය විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට පෙර ස්ථිර වශයෙන් සහ අර්ධ වශයෙන් අබලතාවකට පත්වන යම් දායකයකුට නියමිත පදනම මත ගණන් බැලූ එකවර ලැබෙන පාරිතෝෂිකයක් ලැබිය යුතු අතර, යෝජනා ක්‍රමයෙන් ඉවත්වීම හෝ ඉතුරු දායක මුදල් ගෙවමින් යෝජනා ක්‍රමයේ රැඳී සිට විශ්‍රාම වැටුප ගෙවිය යුතු වන අවස්ථාවේ දී එය ලබා ගැනීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

පූර්ණ අබලතාවකට පත්වීම.

12. ස්වකීය විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට පෙර, ස්ථිර වශයෙන් සහ සම්පූර්ණයෙන් ම අබලතාවකට පත් වන යම් දායකයකු, ස්වකීය මනාපය පරිදි නියමිත පදනම මත ගණන් බැලූ එකවර ලැබෙන පාරිතෝෂිකයක් ලැබිය යුතු අතර, යෝජනා ක්‍රමයෙන් අස්වීම හෝ නියමිත පදනම මත ගණන් බැලූ කාලීන දීමනාවක් ලබාගෙන තවදුරටත් දායක මුදල් නොගෙවා යෝජනා ක්‍රමයේ රැඳී සිටීම හෝ කළ යුතු ය.

මරණ පාරිතෝෂිකය.

13. ස්වකීය විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා හිමිකම් ලැබීමට පෙර, දායකයකුගේ මරණය සිදුවූ විටක නියම කරනු ලැබිය හැකි යම් පදනමක් මත ගණන් බැලූ මරණ පාරිතෝෂිකයක් ඔහුගේ ජීවත්ව සිටින භාර්යාව හෝ ස්වාමිපුරුෂයාට සහ නීත්‍යානුකූල දරුවන්ට හෝ ඔහුගේ ලේ ඥාතීන්ට, මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් පරිදි යම් අනුපාතිකවලට අනුව සහ ප්‍රමුඛතා අනු පිළිවෙලට ගෙවනු ලැබිය යුතු ය.

එක් එක් දායකයා වෙත මණ්ඩලය විසින් ඔප්පු නිකුත් කිරීම

14. මණ්ඩලය විසින් යම් තැනැත්තකු බඳවා ගැනීමේ දී යෝජනා ක්‍රමයට දායකයකු වශයෙන් ඔහු විසින් දිය යුතු දායක මුදල් දැක්වෙන ඔප්පුවක් මණ්ඩලය විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඔප්පුවේ නියම සහ කොන්දේසි ද ඔහු වෙත නිකුත් කරන ලද ඔප්පුව යටතේ ඔහු හිමිකම ලබන ප්‍රතිලාභ ද එහි දැක්විය යුතු ය.

ඔප්පුව අහිමිවීම.

15. (1) දායකයකු විසින් දායක මුදල් ගෙවිය යුත්තේ කවර දිනයකට ප්‍රථමයෙන් ද යන වග ඔප්පුවේ නිශ්චිතව සඳහන් කළ යුතු අතර, අනුක්‍රමික වාරික දහයක් ගෙවීම පැහැර හරින යම් දායකයකුට, ඔහු වෙත නිකුත් කර ඇති ඔප්පුව යටතේ ප්‍රතිලාභ අහිමි විය යුතු ය.

(2) තමා වෙත නිකුත් කරන ලද ඔප්පුව යටතේ වූ ප්‍රතිලාභ යම් දායකයකුට අහිමි වී ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් එම දායකයා වෙත ඒ බවට දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(3) තමාගේ ඔප්පුව නැවත වලංගු කරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත අභියාචනය කිරීමට දායකයකුට අයිතිවාසිකම ඇති අතර, වාරික ගෙවීමට අපොහොසත් වීම, දායකයාගේ පාලනය ඉක්මවා ගිය හේතු නිසා සිදු වී ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම්, මණ්ඩලය විසින් එම ඔප්පුව වලංගු කළ යුතු ය.

(4) ඔප්පුවක් වලංගු කිරීමට මණ්ඩලය තීරණය කරන අවස්ථාවක, හිඟ වාරික ගෙවිය යුත්තේ කවර දිනයකට පූර්වයෙන් ද යන වග දායකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය. එම ගෙවීම කරන දිනය ඔප්පුව වලංගු කරන දිනය විය යුතු ය.

(5) මණ්ඩලයේ තීරණයෙන් අතෘප්තියට පත් යම් දායකයකුට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමට අයිතිවාසිකම් ඇති අතර ඒ පිළිබඳව ඔහුගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

මණ්ඩලය විසින් ප්‍රදානය තීරණය කළ යුතුබව.

16. මෙම යෝජනා ක්‍රමය යටතේ යම් දායකයකු වෙත ප්‍රතිලාභ ප්‍රදානය කිරීම, මණ්ඩලය විසින් යෝජනා ක්‍රමයට අනුකූලව සහ එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සාදන ලද නියෝග වලට අනුකූලව නිශ්චය කළ යුතු ය.

ස්ථාන පරීක්ෂා කිරීම.

17. යම් දායකයකු විසින්, යෝජනා ක්‍රමයට දායකයකු ලෙස බඳවා ගනු ලැබීමට හෝ දායකයකු ලෙස සිටීමට ඔහුට ඇති සුදුසුකම සම්බන්ධයෙන් සපයා තිබෙන තොරතුරුවල සත්‍යතාව තහවුරු කර ගැනීම සඳහා සභාපතිවරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දී තිබෙන මණ්ඩලයේ යම් නිලධරයකු විසින් සේවා නියුක්තිය පවත්නා පරිශ්‍රයට හෝ ස්ථානයට දවසේ කවර හෝ වේලාවක ඇතුළු වී එම ස්ථානය පරීක්ෂා කළ හැකි ය.

අභියාචනය

18. (1) මණ්ඩලය විසින් නිශ්චය කළ යම් ප්‍රතිලාභ ප්‍රදානයක් පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයකු විසින්, එම ප්‍රදානය පිළිබඳව දැන්වීම ලැබී දවස් තිහක් ඇතුළත, අභියාචනයට හේතු දක්වමින් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය.

(2) එවැනි යම් අභියාචනයක් පිළිබඳව ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව පැවරිය නොහැකි බව සහ උසිත් අයකිරීමක් කළ නොහැකි බව.

19. යෝජනා ක්‍රමයෙන් ගෙවිය යුතු කිසි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක් පැවරීම හෝ මාරු කිරීම නොකළ යුතු අතර, එවැනි සෑම පැවරීමක් ම හෝ මාරු කිරීමක් ම මුළුමනින් ම ශූන්‍ය හා බලරහිත හා බලපෑමෙන් තොර විය යුතු ය. එවැනි කිසි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ දීමනාවක් ඒ විශ්‍රාම වැටුප, පාරිතෝෂිකය හෝ දීමනාව ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හේතු වෙන්, තහනමට ගැනීම හෝ ඇස්කීසියක් මගින් අයකර ගැනීම හෝ නොකළ යුතු ය.

## III වන කොටස

## මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

20. (1) සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සහ යෝජනා ක්‍රම පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යම්

3—ඩී 039841 (96/04)

මණ්ඩලය සලකන නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කිරීමටත්, එසේ පත් කරන කවර හෝ නිලධරයකු, අනුයෝජිතයකු හෝ සේවකයකු විෂයයෙන් විනය පාලනය පැවැත්වීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීමටත් මණ්ඩලයට බලය ඇත්තේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට, මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ ගෙවීම් ප්‍රමාණයන් අනුව, එසේ නියම කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට යටත්ව, පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ ඉල්ලීම පිට, කවර හෝ රජයේ නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කළ හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කළ හැකි ය.

(5) යම් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා කෙරෙහි සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(6) යම් රජයේ නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා කෙරෙහි සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(7) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලය යටතේ සේවය කරන යම් කාලසීමාවක්, එම එකඟවීම යටතේ වූ බැඳීම් ඉටුකිරීම සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සැලකිය යුතු ය.

## IV වන කොටස

### මුදල්

මණ්ඩලයේ අරමුදල

21. (1) මණ්ඩලයට මෙහි මින් මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් තිබිය යුතු ය.

(2) මෙහි පහත සඳහන් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :—

(අ) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) යෝජනා ක්‍රමයට දායක මුදල් වශයෙන් දායකයන් විසින් ගෙවනු ලබන සියලු මුදල් ;

(ඇ) අරමුදලට ත්‍යාග සහ පරිත්‍යාග වශයෙන් කවර හෝ ප්‍රභවයකින් ලැබෙන සියලු මුදල් ;

(ඈ) මණ්ඩලයේ ආයෝජනවලින් පොලී හෝ ලාභ වශයෙන් උපයන සියලු මුදල ;

(ඉ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සහ එම මුදලින් ගෙවනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමිත සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

22. මණ්ඩලයට වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ අරමුදලෙහි ඇති සියලු මුදල්, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, බලය දෙනු ලබන, යම් ආකාරයකින් හෝ එසේ බලය දෙනු ලබන යම් සුරැකුම්පත්වල, මණ්ඩලය විසින් ආයෝජනය කළ හැකි ය. මුදල් ආයෝජනය.

23. (1) මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ ඒ අමාත්‍යවරුන් විසින් ඇතිව දෙන ලද යම් පොදු අධිකාරයක් යටතේ ද අනුකූලව මණ්ඩලයේ බැඳීම් ඉටුකිරීම සඳහා සහ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය විය හැකි මුදල්, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ණයට ගැනීම හෝ කොන්දේසි සාකච්ඡා කොට ණය වශයෙන් ලබා ගැනීම කළ හැකි ය. ණයට ගැනීමේ බලය.

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද යම් ණය මුදල් සම්බන්ධයෙන් ආපසු ගෙවීමට ඇති මුදල්වල එකතුව, කිසිම අවස්ථාවක දී, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව පහත දැක්වෙන සියලු කාර්ය හෝ ඉන් යම් කාර්යයක් සඳහා (1) වන උපවගන්තිය යටතේ ණය මුදල් වශයෙන් හැර අන්‍යාකාරයෙන් මුදල් ණයට ලබා ගත හැකි ය.

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය යම් ඉඩම්වල හෝ නිශ්චල දේපළවල බුක්තිය බලකර ලබාගැනීම හෝ අත්කර ගැනීම ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ගන්නා ලද යම් මුදල් ආපසු ගෙවීම.

මණ්ඩලයේ මුදල් වර්ෂය සහ මණ්ඩලයේ ගිණුම් විගණනය

24. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වා ගැනීමට සැලැස්විය යුතු ය

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1979 අංක 28 දරන දේශීය ආදායම් පනත මණ්ඩලයට අදාළ කිරීම.

25. 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා අරමුදල ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලක් විය යුතු බවට සල කනු ලැබිය යුතු ය.

1971 අංක 38 දරන පනත අදාළ කිරීම.

26. 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන මණ්ඩලයට අදාළ විය යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

## V වන කොටස

### සාමාන්‍ය

මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ නිලධරයන් විය යුතු බව.

27. මණ්ඩලයේ සියලු අධ්‍යක්ෂවරයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

28. මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

බලතල හා කාර්ය පැවරීම.

29. (1) මණ්ඩලයේ බලතල සහ කාර්ය කිසිවක් මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයකුට හෝ නිලධරයකුට නැතහොත් සේවකයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරන ලද සෑම තැනැත්තකු විසින් ඒ බලය හෝ කාර්යය මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය ත හෝ ගනු බන ක්‍රියා ම්බන්ධයෙන් රක්ෂා කිරීම.

30 (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව හෝ කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද වියදම් කිසිවක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත, කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරා ඇති යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, එකී වියදම් ඒ නඩු කටයුත්තේ දී ඔහු විසින් අයකර ගනු ලබතොත් හැර, අරමුදලින් ඒ තැනැත්තා වෙත ගෙවනු ලැබිය යුතු ය.

31. අමාත්‍යවරයා විසින්—

නියෝග.

(අ) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ආ) මේ පනත අදාළ වන තැනැත්තකුට යෝජනා ක්‍රමයට බැඳීම විකල්ප හිමිකම් ඇති කරවන සුදුසුකම් ;

(ඇ) මේ පනත අදාල වන තැනැත්තකුට යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලැබෙන කොන්දේසි සහ යටත් විය යුතු සීමාකිරීම් ;

(ඈ) දායකවන්නන් විසින් ගෙවිය යුතු දායක මුදලේ ප්‍රමාණය නිශ්චය කිරීම ;

(ඉ) යෝජනා ක්‍රමය යටතේ දායකවන්නන්හට විශ්‍රාම වැටුප්, පාරිතෝෂික හෝ දීමනා ගෙවිය යුතු පදනම නිශ්චය කිරීම ;

(ඊ) දායකවන්තන් විසින් දායක මුදල් ගෙවීම පැහැර හැරීම, ඔප්පුව පවාරණය කිරීම සහ දායකයකුගේ යෝග්‍යත්වය නැතිවීම පාලනය කෙරෙන කොන්දේසි ;

(උ) මණ්ඩලය විසින් වැඩ කටයුතු කිරීමේ කාර්ය පටිපාටිය ;

(ඌ) මේ පනත යටතේ නිකුත් කරන ලද ඔප්පුවක් අවලංගු කිරීම හෝ අහිමි කිරීම ; සහ

(එ) දායකවන්තයකුගේ අර්ධ හෝ පූර්ණ අබලතාව තීරණය කිරීමේ පදනම

ඇතුළුව මේ පනතින් නියෝග සෑදීමට බලය දී ඇති හෝ නියම කරනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වුව හොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

31. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

" සභාපතිවරයා " යන්නෙන් 3 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ පත් කරන ලද සභාපතිවරයා අදහස් වේ ;

" අධ්‍යක්ෂවරයා " යන්නෙන් 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂවරයකු අදහස් වේ ;

"පළාත් පාලන ආයතනයක්" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග වලින් නියමිත බව අදහස් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

## පළමුවන උපලේඛනය [3 (4) වගන්තිය]

### මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකළ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් (අත්හිටවූ දණ්ඩන නියමයක් ඇතුළුව) බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් පනවනු ලැබූ තැනැත්තකු වේ නම් ; හෝ

(ඉ) අධ්‍යක්ෂවරයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් වේ නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ පත් කළ අධ්‍යක්ෂවරයකු වශයෙන් දිගටම කටයුතු කිරීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2. අමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් අධ්‍යක්ෂවරයකු විසින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

3. අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කළ හැකි අතර රිට් ආඥාවක් මගින් හෝ වෙනත් ආකාරයකින් එය යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

4. (1) සෑම අධ්‍යක්ෂවරයකු ම මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබ සිටින්නේ නම් මිස, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් විය යුතු ය :

එසේ වුව ද මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධුරය හිස් කර ඇති අධ්‍යක්ෂවරයකු වෙනුවට පත්කරනු ලබන තැනැත්තකු ඔහු කලින් ධුරය හිස් කළහොත් මිස ඔහු අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දරිය යුතු ය.

(2) සභාපතිවරයාට හෝ වෙනත් යම් අධ්‍යක්ෂවරයකුට අසනීප වීම, අබලතාවට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් යම් අධ්‍යක්ෂවරයකු හෝ එම අධ්‍යක්ෂවරයා වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකු හෝ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

5. සභාපතිවරයාට සහ අධ්‍යක්ෂවරුන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිශ්‍රමිකයන් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

6. මණ්ඩලය විසින් එළඹෙන හෝ එළඹීමට යෝජිත ගිවිසුමකට කෙළින්ම හෝ අනියමින් සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී අනාවරණය කිරීම කළ යුතු ය. මේ අනාවරණය කිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල වාර්තා කළ යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා එම ගිවිසුම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය. එසේ වුව ද යම් අධ්‍යක්ෂවරයකු රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂවරයකු වීමේ හේතුවෙන් ගිවිසුමකට ඒ අධ්‍යක්ෂවරයාට ඇති සම්බන්ධතාව මේ ඡේදය යටතේ අර්ථානුකූලව සම්බන්ධතාවය වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

7. (1) තත්කාර්යය සඳහා අමාත්‍යවරයාට යොමු කරනු ලබන ලිපියක් මගින් සභාපතිවරයා විසින් සභාපති වශයෙන් වූ ඔහුගේ ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ වේලාවක හේතුවක් නොදක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්වයේ කාලය විය යුතු ය.

8. (1) මේ ඡේදයේ අනෙකුත් විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් එහි රැස්වීම් පිළිබඳව සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳව කාර්ය පරිපාටිය විධිමත් කරගත හැකි ය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය අධ්‍යක්ෂවරුන් හතර දෙනකු විය යුතු ය.

9. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් අධ්‍යක්ෂවරයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසියම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

10. (1) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට මණ්ඩලයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් කළ යුතු අධ්‍යක්ෂවරුන් දෙදෙනකු ඉදිරියේ හැර, මණ්ඩලයේ මුද්‍රාව කිසියම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳව ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතු ය,

දෙවන උපලේඛනය (13 වන වගන්තිය)

මරණ පාරිතෝෂිකය ගෙවිය යුතු අනුපාත සහ ප්‍රමුඛත්ව අනු පිළිවෙල පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) මරණ පාරිතෝෂිකයෙන් අඩක් හෝ සියයට පණහක් ජීවත්ව සිටින කලත්‍රයාට සහ

(ආ) ඉතිරි සියයට පනහ මියගිය දායකයාගේ ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමසේ කොටස් කරනු ලැබිය යුතු ය.

(ඇ) කලත්‍රයා ජීවත්ව නොසිටී නම් මරණ පාරිතෝෂිකය සම්පූර්ණයෙන්ම මියගිය දායකයාගේ ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමසේ බෙදා දෙනු ලැබිය යුතු ය ;

(ඈ) ජීවත්ව සිටින සුජාත දරුවන් නොමැති නම් සම්පූර්ණ මරණ පාරිතෝෂිකය ම ජීවත්ව සිටින කලත්‍රයාට ගෙවිය යුතු ය.

(ඉ) මියගිය දායකයාගේ ජීවත්ව සිටින කලත්‍රයකු හෝ ජීවත්ව සිටින සුජාත දරුවන් නොමැතිනම් මරණ පාරිතෝෂිකය පහත දක්වෙන පරිදි ගෙවනු ලැබිය යුතු ය :—

(i) මවපිය දෙදෙනාගෙන් එක්කෙනෙකුට වඩා ජීවත්ව සිටී නම් එය ජීවත්ව සිටින මවපියන්ට සමසේ ගෙවිය යුතු ය ;

(ii) දෙමව්පියන්ගෙන් එක් තැනැත්තකු පමණක් ජීවත්ව සිටීනම් එය සම්පූර්ණයෙන්ම එම තැනැත්තාට ගෙවිය යුතු ය ;

(iii) ජීවත්ව සිටින එක් සහෝදරයකුට සහ සහෝදරියකට වඩා සිටී නම්, එය ජීවත්ව සිටින සහෝදරයන්ට සහ සහෝදරියන්ට සමසේ ගෙවිය යුතු ය ;

(iv) ජීවත්ව සිටින එක් සහෝදරයකු හෝ සහෝදරියක පමණක් සිටී නම් එය සම්පූර්ණයෙන්ම ඒ සහෝදරයාට හෝ සහෝදරියට ගෙවිය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස් වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.